මිල්කෝ පුද්ගලික සමාගම - 2022
--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 වියාචනය කළ මතය

මිල්කෝ පුද්ගලික සමාගමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන

සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02 හි 09 ඡේදය අනුව අවසන් නිෂ්පාදිත නිමි තොගය ගණනය කිරීමේදී පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට අවසන් තොගය වාර්තා කළ යුතු වුවද සමාගම විසින් දිගන කර්මාන්තශාලාවේ අවසන් නිෂ්පාදිත නිමි තොගයේ ශුද්ධ උපලබ්ධි වටිනාකම වූ රු.46,872,232ක් වෙනුවට පිරිවැය අගය වූ රු.50,661,862ක් ගිණුම්ගත කිරීම හේතුවෙන් සමස්ත තොග ශේෂය රු.3,789,630ක් වැඩියෙන් දක්වා තිබුණි.	දිගන කර්මාන්තශාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙලකිරීමේදී අවසන් නිමි තොගය ලෙස කර්මාන්තශාලා මිලට ගණනය කරන ලද තොගයේ වටිනාකම අත්වැරදීමකින් ඇතුලත් වී ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02 හි 09 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 අනුව රු. 205,000,000 ක් වූ දිගුකාලීන ස්ථාවර තැන්පතුව නිදහස් කිරීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒම් ලෙස දක්වා නොතිබුණි. ප්‍රමිතයේ 7 ඡේදය ප්‍රකාරව මාස 03 හෝ 03ට අඩු කාලයක දී කල් පිරෙන ආයෝජන මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ හි ඇතුළත් කළ යුතු වුවද නිදහස් කළ තැන්පතුව නැවත කෙටිකාලීන ආයෝජන ලෙස ආයෝජනය කර තිබුණු අතර එම ආයෝජනය කිරීම වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ හි එකතුවක් ලෙස දැක්විය යුතු වුවත් එලෙස ගිණුම්ගත කර නොතිබුණි.	අත්වැරදීමකින් සටහන් කිරීම නිසා අදාල වෙනස්කම් සිදුවී ඇත. ඉදිරි වර්ෂවලදී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි ආකාරයෙන් අදාල ස්ථාවර තැන්පතු ගිණුම් සටහන් තැබීමට කටයුතු කරන්නෙමු.	මුදල් ප්‍රවාහයන් නිවැරදිව හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමට කටයුතු කළ යුතුවේ.
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 31 සහ 34 ඡේද අනුව වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදුකල පසු නැවතත් නිශ්චිත කාල සීමාවක් තුලදී වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකල යුතු වුවද සමාගම විසින් 2008 වර්ෂයෙන් පසු සමාලෝචිත වර්ෂය දක්වාම වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදු නොකර තිබීම හේතුවෙන් නව ප්‍රත්‍යාගණිත වටිනාකම් ගිණුම් පොත් වල ඇතුලත් වී නොතිබුණි.	කළමණාකාරීත්වය දැනුවත් කොට ඉදිරියේදී වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදුකිරීමට බලාපොරොත්තු වේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 31 සහ 34 ඡේද ප්‍රකාරව කටයුතු කළ යුතුවේ.
(ඈ)	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 හි 5.5.15 ඡේදය ප්‍රකාරව වෙළඳ ණයගැති ශේෂය වන රු.539,538,417ක් සඳහා පසුකාලීන හානිකරණ හඳුනාගැනීම් මැනීම සඳහා අපේක්ෂිත ණය අලාභ ක්‍රමය (Expected Credit Loss Method) භාවිතා	මේ වන විට මූල්‍ය ප්‍රකාශන තුල රු.539,538,417 ක් වන වෙළඳ ණයගැතියන්ගෙන් රු.50,913,625 ක ප්‍රමාණයක් සඳහා අඩමාණ ණය සඳහා වෙන් කිරීම් සිදු කර ඇත.	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 හි 5.5.15 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ.

කළයුතු වුවත් එසේ ගණනය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ වෙළඳ හා අනෙකුත් ණයගැතියන් අධි හෝ ඌණ ගණනය වී තිබුණි.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රධාන කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ගෙවිය යුතු ශේෂයන් තුල එකතුව රු.48,184,538ක් ද වෙළඳ ණයහිමි ශේෂය තුළ රු.12,278,092 ක් වූ හර ශේෂයක් ද ප්‍රධාන කාර්යාලය, කොළඹ, පොල්ගහවෙල සහ දිගන කිරි කර්මාන්තශාලාවට අදාළ ණයගැති ශේෂය තුල රු.42,699,675 ක් වූ බැර ශේෂ පැවතීම නිසා මුළු ගෙවිය යුතු ශේෂය, වෙළඳ ණයහිමි ශේෂය හා මුළු ණයගැති ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	මෙම බැර සහ හර ශේෂයන් දීර්ග කාලයක සිට පැවත එන ශේෂයන් වන අතර මෙම ශේෂ ගිණුම්කරණ දෝෂ මත හා ලියකියවිලි දෝෂ මත හටගෙන ඇති නමුත් වර්තමානය වන විට එම ශේෂයන් පිළිබඳව විශ්ලේෂණය කිරීමක් සිදු කරමින් පවතින අතර ඒවා නිරවුල් කිරීමට කටයුතු කරමි.	ගිණුම් ශේෂ හිලව් නොකර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ.
(ආ)	විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛණය අනුව ප්‍රධාන කාර්යාලය විසින් 2005 සිට 2022 වර්ෂය දක්වා අවස්ථා 90කට අදාලව සිදු කරන ලද එකතුව රු.8,804,121 ක (Unsettled Pre Payment) කලින් ගෙවීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ණයහිමියන් යටතේ හර ශේෂ ලෙස දක්වා තිබුණි.	එම ගිණුම්කරණ දෝෂය 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ජංගම වත්කම් යටතේ ඉදිරිපත් කර නිවැරදි කිරීමට කටයුතු කර ඇත.	කලින් ගෙවීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ.
(ඇ)	රු.131,829,724ක් වූ අත්තිකාරම් , තැන්පතු සහ කලින් ගෙවීම් යටතේ දක්වා ඇති එකතුව රු.1,606,085ක් වූ බැර ශේෂ පැවතීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම එම ප්‍රමාණයෙන් ඌණ ගණනය වී තිබුණි.	මෙම බැර ශේෂයන් ගිණුම්කරණ දෝෂ මත ඇතිවූ ශේෂයන් වන අතර මේ වනවිට අදාල බැර ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.	ගිණුම් ශේෂ හිලව් නොකර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ.
(ඈ)	ඉකුත් වර්ෂයට අදාළ රු.1,335,985 ක් වූ කුලී වියදම සමාලෝචිත වර්ෂයේ කුලී වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.	අදාල වෙනස මගින් නිරූපනය වනුයේ 2021 වසරේ දෙසැම්බර් 20 වන දින සිට 2022 ජනවාරි 19 දක්වා කාලපරිච්ඡේදය සඳහා ගෙවන ලද මාසික කුලී වියදම වේ.	වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ.

(ඉ)	භාවිත අයිතිය ඇති සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගෙවීම අවසන් වූ රු. 50,934,183 ක් වූ වත්කම් (Right of use assets) මොටර් රථ ගිණුමට මාරු නොකර භාවිත අයිතිය ඇති වත්කම් යටතේ ඇතුලත් කර තිබූ අතර ඊට අදාල ක්ෂය ගණනය කර ගිණුම්ගත කර ද නොතිබුණි.	මෙම ගිණුම්කරණ දෝෂය 2023 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදි නිවැරදි කර ඇත.	භාවිත අයිතිය ඇති වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ.
(ඊ)	බඩල්ගම කිරි සැකසුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.12,641,310,517 මුදලක් 2021 වර්ෂයේදී කෘෂිකර්ම අමාත්‍යාංශයේ 118-2-3-54-2507-0/12 වැය විෂය යටතේ ගිණුම්ගත වී තිබුණද සමාගම විසින් භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය ලෙස රු.12,641,310,517ක් මූල්‍ය ප්‍රකාශනයන්හි හඳුනාගෙන තිබුණි. එසේ වුවද මෙම ණය මුදල සම්බන්ධයෙන් භාණ්ඩාගාරය සහ සමාගම අතර උප ණය ගිවිසුමක් ද නොවීය.	මේ පිළිබඳ වැඩිදුර සොයාබලා වගකිවයුතු පාර්ශවයන් වෙතින් කරුණු විමසීමෙන් අනතුරුව මෙම ණය ශේෂයන් සමාගමේ ගිණුම් තුලින් ඉවත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	අදාල ණය ශේෂය ගෙවීමට පවතින ශේෂයක්ද නැද්ද යන්න නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ.
(උ)	මූල්‍ය ප්‍රකාශනයන්හි රාජ්‍ය ප්‍රදාන යටතේ දක්වා ඇති එකතුව රු.16,167,750ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන වසර 05 කට වැඩි කාලයක සිට පැවති අතර මීට අදාලව විලම්භිත ආදායම් ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	රාජ්‍ය ප්‍රදාන යටතේ GRANT OF LCRD වන රු 16,000,582 ක් ශේෂය විලම්භිත ආදායම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනය තුල ගිණුම් ගත කිරීම 2023 වර්ෂයේ සිට ආරම්භ කර ඇත. රු 52,776 ක් වන ශේෂය ගිණුම් ගත කර තිබුණද මෙතෙක් එම මුදල ලැබී නොමැත. රු 114,392 ක් වන ශේෂයට අදාල ලේඛන නොමැත.	රජයේ ප්‍රදාන වලට අදාල විලම්භිත ආදායම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුවේ.
(ඌ)	පොළොන්නරුව කර්මාන්තශාලාවට අදාළව මහජන බැංකුවේ ජංගම ගිණුමේ 2019 සිට 2022 වර්ෂය දක්වා තැන්පත් කරන ලද එකතුව රු.2,611,447 ක් වූ හඳුනා නොගත් තැන්පතු හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	පොළොන්නරුව කර්මාන්තශාලාවේ බැංකු සැසඳුම් ප්‍රකාශය තුල තිබූ රු.2,611,447 ක හඳුනානොගත් තැන්පතු ශේෂයන් 2023 හා 2024 වර්ෂවලදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත.	හඳුනානොගත් තැන්පතු හඳුනාගෙන නිරවුල් කර නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ.
(එ)	පොළොන්නරුව කර්මාන්තශාලාවේ රු.6,903,437ක් වූ විවිධ ආදායම් වලට අදාළ විස්තරාත්මක උපලේඛණයන් විගණනයට ඉදිරිපත් නොවුණි.	අදහස් දක්වා නොතිබුණි.	ආදායම් වලට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ.

(ඒ)	මූල්‍ය ප්‍රකාශන තුළ තොග වෙනුවෙන් රු.12,096,362ක වෙන්කිරීමක් සිදුකර ඇති අතර මේ තුල වූ භාවිතයට ගත නොහැකි තොග හඳුනාගෙන පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.	වසර ගණනාවකට පෙර ගබඩාවන් තුල පැවති භාවිතයට ගත නොහැකි තොග (Redundant Stock) සඳහා ගිණුම් තුල සිදු කරන ලද වෙන් කිරීමකි.	භාවිතයට ගත නොහැකි තොග හඳුනාගෙන විධිමත්ව අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ.

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.	අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.	වෙනස රු.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අත ඉතිරි මුදල්	12,900,177	12,319,915	580,262	ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අදාල වටිනාකම වෙනත් ණයහිමි ශේෂය තුල ඇතුලත් කර ඇත.	අත ඉතිරි මුදල් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ.
(ආ)	ජංගම ගිණුම් මුදල් ශේෂ	28,520,740	28,132,671	388,069	දිගන කර්මාන්තශාලාවේ අවසන් ගිණුම් තුල පැවති අත්පිට මුදල් පාලන ගිණුම හා බැංකු හා මුදල් ගිණුමේ ශේෂ අතර සිදුව තිබූ ගිණුම්කරණ දෝෂය සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එම නිවැරදි කිරීම සිදුව නොමැති වීම මත අදාල වෙනස හටගෙන ඇත.	නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ.

1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂයය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වෙළඳ සහ අනෙකුත් ණයහිමි (ප්‍රධාන කාර්යාලය)	32,737,312	ශේෂ සනාතන, උප ලේඛන	සියළුම ණයහිමියන් සඳහා ශේෂ සනාථන ලිපි විගණන කාර්යාලය වෙත ලබාදෙන ලෙසට දැනුවත් කරමින් ලියාපදිංචි තැපැල හරහා ලිඛිතව දන්වා ඇත.	ශේෂ සනාථ කරගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුවේ.
(ආ)	ණයගැති ශේෂ	30,134,273	ශේෂ සනාථන, උප ලේඛන	ශේෂ සනාථන ලිපි විගණන කාර්යාලය වෙත ලබාදෙන ලෙස විගණන කාර්යාලයේ ලිපිනය ඇතුලත් කොට අදාල ණයගැති පාර්ශව වෙත ලියාපදිංචි තැපැල මාර්ගයෙන් ඉල්ලීම් ලිපි යවා ඇති අතර නැවත දුරකථන මාර්ගයෙන් දැනුම් දීමටද කටයුතු කර ඇත.	ශේෂ සනාථ කරගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුවේ.
(ඇ)	ජාතික කිරි මණ්ඩලයට ගෙවියයුතු	2,108,063	ශේෂ සනාතන, කාල විශ්ලේෂණ	මෙම ශේෂයන් වසර ගණනාවක් තිස්සේ ගිණුම් තුල පැවතගෙන එන ශේෂ වන අතර ඒවා සනාථ කිරීම සඳහා කිසිදු මූලාශ්‍ර ලියවිල්ලක් සමාගම සතුව සොයාගැනීමට නොහැක.	මෙම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අඹේවෙල, දිගන, කොළඹ, පොල්ගහවෙල, පොළොන්නරුව කර්මාන්තශාලාවල අවු 05 ඉක්ම වූ එකතුව රු.95,597,421ක ණයගැති ශේෂ අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම ශේෂයට ඇතුලත් ණයගැතියන්ගේ ශේෂ වලින් වැඩි ප්‍රමාණයක ශේෂ සැකසී ඇති ආකාරය පිළිබඳ විස්තර පවතින අතර ඇතැම් ශේෂ සැකසී ඇති ආකාරය පිළිබඳව මූලාශ්‍ර ලේඛන	හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ.

		සොයාගැනීමේ අසීරුතාවය මත අදාල ශේෂ සැකසී ඇති විස්තරයක් සකස් කිරීමට නොහැකි වී ඇත.	
(ආ)	සමාගම විසින් ගෙවන ලද අත්තිකාරම්, තැන්පතු සහ කලින් ගෙවීම් යටතේ වසර ගණනාවක සිට පැවත එන එකතුව රු.29,035,960 ක් වූ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	අදහස් දක්වා නොතිබුණි.	අදාළ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ.
(ඇ)	මූල්‍ය ප්‍රකාශන අනුව දිගන කර්මාන්තශාලාවේ සේවකයන් වෙත ණයට කිරිපිටි නිකුත් කිරීමට අදාළව රු.1,185,342ක් ශේෂයක් වර්ෂ ගණනාවක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙය 2014 වසරට පෙර සිට පැවත එන්නක් වන අතර එය අයකරගැනීමට අදාල තොරතුරු ගිණුම් අංශය තුල නොපවතී.	අදාල පාර්ශවයන් හදුනාගෙන හිග මුදල් අය කිරීමට කටයුතු කළ යුතුවේ.

1.6.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වර්ෂ 01 ත් 05 ත් අතර ණයහිමියන් රු.2,573,997 ක් ද වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.11,192,807 ක් වූ ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ගිණුම්කරණ දෝෂ නිසා දිගින් දිගටම පවතින ශේෂයන් මේ වනවිට නිරවුල් කරමින් පවතින නමුත් ඇතැම් ශේෂ සනාථ කිරීම සදහා අවශ්‍ය අදාල මූලාශ්‍ර ලේඛන ප්‍රධාන කාර්යාලයේ මූල්‍ය අංශය තුල සොයාගැනීමට අපහසු වී ඇත.	හිඟ ණය හිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ.

1.6.3 අත්තිකාරම්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අඹේවෙල කර්මාන්තශාලාවට අදාළව සැපයුම්කරුවන් 24 දෙනෙකු සඳහා එකතුව රු.1,268,431ක මිලදී ගැනීම් අත්තිකාරම් (Purchase Advances) ශේෂය විගණිත දිනය වූ 2025 ජූනි 30 දින වන විටත් අය නොවී පැවතුණි.	අදාල අත්තිකාරම් ශේෂයන් පියවා ගැනීම සඳහා සමාගම විසින් දැනටමත් කටයුතු කරමින් පවතින අතර ඒ අනුව රු. 160,000 ක් අයකරගෙන ඇත.	මිලදී ගැනීම් වෙනුවෙන් ගෙවූ අත්තිකාරම් වටිනාකම අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 නොවැම්බර් 16 දින අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මෙහෙයුම් අත්පොත හා මාර්ගෝපදේශයේ			
	i. 2.3 වගන්තිය	සමාගම විසින් 2022 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් ඉදිරිපත් කර නොතිබුණු අතර පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි මාර්ගෝපදේශයට අනුව තොරතුරු ඇතුළත් නොවූ අතර ඉලක්ක ගත වැඩසටහන් පිළිබඳව පමණක් තොරතුරු ඇතුළත් කර තිබුණි.	අදහස් දක්වා නොමැත	චක්‍රලේඛ විධිවිධාන අනුව අයවැය ලේඛණයක් සකස්කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ.
	ii. 6.6. වගන්තිය	ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2025 පෙබරවාරි 05 වන දිනය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට දින 705 ක් ප්‍රමාද වී තිබුණි. තවද රාජ්‍ය ව්‍යාපාර සඳහා අදාල වන මාර්ගෝපදේශයේ ඇමුණුම 3 හි සඳහන් පරිදි කෙටුම්පත් වාර්ෂික වාර්තාව සකස් කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි.	අදහස් දක්වා නොමැත	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික වාර්තා සකස්කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ.
(ආ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1.(ආ) ඡේදය	සමාගම විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා වර්ෂය සඳහා නිතිපතා යාවත්කාලීන කරන ලද ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	අදහස් දක්වා නොමැත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතුවේ.

1.8 මුදල් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
එක්සත් ජනපද ඩොලර් ස්ථාවර තැන්පතුව ඇපයට තබමින් ලංකා බැංකු ජංගම ගිණුම වෙනුවෙන් ලබාගෙන ඇති රු.1,200,000,000 ක බැංකු අයිරා පහසුකම සඳහා 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුල රු.815,549,265 ක් බැංකු අයිරා පොලිය ලෙස දරා තිබුණු අතර එයට අදාළ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.458,910,062ක් විය. ඒ අනුව රු.356,639,203 ක අතිරේක පිරිවැයක් දරා තිබුණු අතර බැංකු අයිරාව අඩු කර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු විය යුතු බව නිරීක්ෂණය විය.	2022 වර්ෂයේදී අනුමත කර ලබාගෙන ඇති අයිරා පහසුකම වැඩි වශයෙන් භාවිතා කර ඇති බැවින් ඒ සඳහා වැඩි අයිරා පොළී ප්‍රමාණයක් බැංකුව විසින් අයකරගෙන ඇති බැවින් ඊට අදාලව ඇප තබා ඇති ස්ථාවර තැන්පතුවට අදාල පොළී ආදායම ඉක්මවා ගොස් ඇත.	බැංකු අයිරා ශේෂය අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.473,942,776 ක අලාභයක් වූ අතර ඊට අනුරූපඉකුත් වර්ෂයේ අලාභය රු. 161,908,810 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.312,033,966 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විකුණුම් පිරිවැය ඉහල යාම, පරිපාලන වියදම් ඉහලයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) සමාලෝචිත වර්ෂයේදී සමාගමෙහි සමස්ථ විකුණුම් ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 5.49ක වර්ධනයක් පෙන්නුම් කළ ද විකුණුම් පිරිවැය ඊට සාපේක්ෂව සියයට 12.73කින් වර්ධනය වී තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව විකුණුම් පිරිවැයෙහි ඇතුලත් ප්‍රාථමික පිරිවැය රු.1,299,796,119 කින් එනම් සියයට 12.58 කින්ද, බලශක්ති පිරිවැය රු.577,855,524 කින් එනම් සියයට 102.62 කින්ද, ආන්තික පිරිවැය රු. 2,026,093,823 කින් එනම් සියයට 17.79 කින්ද ඉහළ යාම විකුණුම් පිරිවැයෙහි වර්ධනයට බලපා තිබුණි. පසුගිය වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 9.5 ක් වුවද සමාලොචිත වර්ෂයේ එය සියයට 3.29 ක් විය. ඒ අනුව දළ ලාභය සියයට 63.5 කින් අඩු වී තිබුණි.

(ආ) විදේශ විනිමය ලාභ හේතුවෙන් සමාගමේ අනෙකුත් ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 725 කින් වර්ධනය වී තිබුණි. මූල්‍ය ආදායම සියයට 188 කින් වර්ධනය වී තිබුණි. ඊට සාපේක්ෂව මූල්‍ය වියදම සියයට 71 කින් අඩු වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පරිපාලන වියදම් සහ බෙදාහැරීමේ වියදම් පිළිවෙලින් සියයට 25 කින් සහ සියයට 19 කින් වර්ධනය වී තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

(අ) සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය, ක්ෂණික වත්කම් අනුපාතය, දළ ලාභ අනුපාතය, ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් 1.18 ක් 0.39ක්, සියයට 3.29, සහ සෘණ 3.60 වූ අතර පෙර වර්ෂයේ එම අනුපාතයන් පිළිවෙලින් 1.99ක් 0.76ක්, සියයට 9.50ක් සහ සෘණ 1.30 ක් විය. ඒ අනුව මෙම අනුපාතයන් හි පිරිහීමක් නිරීක්ෂණය විය. ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතයන්ගේ අඩුවීමක් පැවති අතර මේ හේතුවෙන් සමාගම කාරක ප්‍රාග්ධන ගැටළුවකට මුහුණ පා ඇති බව නිරීක්ෂණය විය. ක්ෂණික වත්කම් අනුපාතය 0.39 ක් වූ අතර සමාගමේ ජංගම වගකීම් පියවීමට ප්‍රමාණවත් ද්‍රවශීල වත්කම් නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) සමාගමේ සමාලෝචිත වර්ෂයේ දල ලාභ අනුපාතය සියයට 3.29 ක් හා ශුද්ධ ලාභ අනුපාතය සියයට 3.60 ක සෘණ අගයක් ගෙන තිබීම සමාගමේ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපාන බව නිරීක්ෂණය විය. තවද කොටසක ඉපැයුම සමාලෝචිත වර්ෂයේදී සෘණ 0.56 ක් වූ අතර පෙර වර්ෂයේදී එය සෘණ 5.07 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ කොටස් ප්‍රාග්ධනයට ඉපැයීමක් සිදු කර නොමැති අතර ආයතනයේ මෙහෙයුම් අකාර්යක්ෂමතාවයක් සහ කාර්යසාධනය දුර්වල මට්ටමක පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වෙළඳපොලට නිකුත් කිරීමේ අරමුණින් තොරව සේවක සුභසාධන පදනමින් පමණක් නිෂ්පාදනය කරන ග්‍රෑම් 750 Butter Bulk Staff Pack විකුණුම් මිල රු.330 ක් වූ අතර බටර් කිලෝග්‍රෑම් 1 හි කර්මාන්තශාලා මිල සමාලෝචිත වර්ෂයේ රු.1,700 ත් රු.2,753 අතර පරාසයක විය. සමාලෝචිත වර්ෂයේ ග්‍රෑම් 750 බටර් පැකට් 14250 ක් ආයතනයේ සේවකයින් වෙත අලෙවි කිරීම මගින් රු. 4,702,500 ක ආදායමක් උපයා තිබුණද මෙම බටර් කිලෝග්‍රෑම් 1 හි කර්මාන්තශාලා මිලට සාපේක්ෂව අලෙවි නොකිරීම හේතුවෙන් වර්ෂය තුළ සිදු වූ විකුණුම් ආදායම අහිමි වීම රු.19,485,795 ක් විය.	මෙය සමාගම විසින් කළමණාකාරීත්වයේ අනුමැතිය ඇතිව දීර්ගකාලයක සිට මාසිකව සුභ සාධන පදනමින් යුතුව සමාගමේ ස්ථිර සේවකයින් සඳහා බටර් 750g ක එක් අයිත්මය බැගින් ලබාදෙන්නක් වන අතර අදාල අයිතමයේ නිෂ්පාදන පිරිවැයට සාපේක්ෂව එක් බටර් 750gක කැබැල්ලක් සේවකයෙකුට විකිණීම මත සිදුවන අලාභය 2022-12-31 දිනට ආසන්නව රු 614 ක් පමණ වේ. ඒ අනුව ගණනය කිරීම් අනුව සඳහන් කර ඇති ආදායම් අහිමිවීමක් සමාගමට සිදු නොවේ.	සමාගම දිගින් දිගටම පාඩු ලබන තත්ත්වයක් තුල සේවක සුභසාධන වියදම් අවම කිරීම සහ නිෂ්පාදන විකුණුම් වැඩි කර ආදායම් වර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ.
(ආ)	කෙරීගෙන යන වැඩ වල ඇතුළත් ගැටඹේ අලෙවි සැල ඉදි කිරීම, දිගන කිරි කර්මාන්ත ශාලාවේ අයිස්ක්‍රීම් කප් සහ කෝන් පිරවුම් යන්ත්‍රය ස්ථාපනය කිරීම සහ පොළොන්නරුව, අඹේවෙල සහ දිගන කර්මාන්ත ශාලා නවීකරණ	වසර ගණනාවකට පෙර රු 150,000ක මුදලක් නුවර ගැටඹේ ප්‍රදේශයේ අලෙවිසැලක් ඉදිකිරීම වෙනුවෙන් ගෙවා ඇති අතර එය මෙතෙක් ඉදිකර අවසන් කර නොමැත. රු.15,445,887ක් වටිනා	දීර්ඝකාලීනව පැවත එන කෙරීගෙන යන වැඩ ශේෂයන් වලට අදාල වැඩ කටයුතු කඩිනමින් සම්පූර්ණ කර අදාල ශේෂයන්

	කෙරීගෙන යන වැඩ වලට අදාලව පිළිවෙලින් රු.150,000 ක්, රු.15,445,587 ක් සහ රු.790,264,562 ක් වන ශේෂ 2012 වර්ෂයේ සිට අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පැවති අතර එම ඉදිකිරිම් හා නවීකරණ කටයුතු නිමකර නොතිබුණි.	අයිස්ක්‍රීම් කප් හා කෝන් පිරවීමේ යන්ත්‍රයක් මීට වසර කිහිපයකට පෙර දිගන කර්මාන්තශාලාව වෙත මිලදීගෙන ඇතත් එය මෙතෙක් භාවිතාකල හැකි මට්ටමකට පත්කර නොමැත. කර්මාන්තශාලා නවීකරණ වැඩ සටහන් යටතේ දිගන කර්මාන්තශාලාව වෙනුවෙන් රු.790,264,562 ක මුදලක් යොදවා තිබුනද මේ වන තෙක් එම නවීකරණ කටයුතු අවසන් කර නොමැත.	ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුවේ.
(ඈ)	ප්‍රධාන කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනය තුල ඇතුලත් බදු සඳහා වෙන්කිරීම් ශේෂය තුල වසර ගණනාවක සිට පැවත එන රු. 8,425,296 ක ආදායම් බදු දඩ මුදල් වෙන්කිරීම් ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.	ප්‍රධාන කාර්යාලයේ ගිණුම් තුල බදු සඳහා වෙන් කිරීම් යටතේ දක්වා ඇති ගෙවිය යුතු ආදායම් බදු සඳහා දඩමුදල් 2003 වසරේදී පමණ ගිණුම්ගත කර ඇති නිසා අදාල ශේෂය සනාථ කිරීම සඳහා තොරතුරු ගිණුම් අංශයේ නොමැත.	මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ.
(ඇ)	අඹේවෙල කර්මාන්තශාලාව ස්ථාපිතව ඇති රජයට අයිති ඉඩම අක්කර 40 රූඩ් 01 පර්චස් 36 ක් වන අතර එහි සමාගම විසින් රු. මිලියන 5,548 ක් වටිනා ඉදිකිරීම් හා සවිකිරීම් කර ඇති නමුත් මෙම ඉඩමේ අයිතිය 2022 දෙසැම්බර් 31 දක්වාම සමාගමට පවරාගෙන නොතිබුණි.	රජය විසින් අඹේවෙල කර්මාන්තශාලාව පිහිටි ඉඩම ඇතුලුව තවත් ඉඩම් 37ක ප්‍රමාණයක් මිල්කෝ ආයතනය වෙත වසර 50ක බදු පදනමින් ලබාදීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇතත් මේ වනතුරු එම ඉඩම් සඳහා බදු ඔප්පු ලබාදීමට රජය විසින් කටයුතු කර නොමැත.	ඉඩමේ අයිතිය සමාගමට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුවේ.